සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2021 ජනවාරි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2021-03-13
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සැම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ යෙදවුමක් වන්නේ කුමක් ද?

(1) දෛනික ගැනුම් පොත. (2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

(3) ගනුදෙනු. (4) මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයක් (stakeholder) වන්නේ කවුරුන් ද?

(1) සේවකයන්. (2) කළමනාකරුවන්.

(3) රජය. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.3** "පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] යන දෙකෙන් අඩු අගයට තොග අගය කරනු ලැබේ".

ඉහත ප්‍රකාශයට අදාළ වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) ආරක්ෂණ සංකල්පය. (2) අඛණ්ඩ පැවැත්ම සංකල්පය.

(3) අස්තිත්ව සංකල්පය. (4) උපචිත සංකල්පය.

**1.4** අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වය විසින් පාලනය කරනු ලබන වර්තමාන ආර්ථික සම්පතක් සළකනු ලබන්නේ:

(1) වත්කමක් ලෙසයි. (2) වගකීමක් ලෙසයි.

(3) ස්කන්ධයක් ලෙසයි. (4) ආදායමක් ලෙසයි.

**1.5** පහත සඳහන් ගනුදෙනු අතුරෙන්, වත්කම් වැඩිවීමට හේතු වන්නේ කුමක් ද?

(1) නැවත විකිණීම සඳහා රු.100,000/- ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට මිලදී ගැනීම.

(2) රු.50,000/- ක විදුලි බිල්පතක් ගෙවීම.

(3) කාර්යාලයේ භාවිතය සඳහා රු.100,000/- ක් වටිනා පරිගණකයක් ණයට මිලදී ගැනීම.

(4) ව්‍යාපාරයේ අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා පිරිවැය රු.100,000/- ක් වූ භාණ්ඩ ලබාගෙන තිබීම.

**1.6** "අස්තිත්වයක් විසින් දැකිය හැකි අනාගතයක් දක්වා තම මෙහෙයුම් නොකඩවා කරගෙන යන බව උපකල්පනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි."

ඉහත ප්‍රකාශය වඩාත් හොඳින් පැහැදිලි කරන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) කාලච්ඡේද සංකල්පයයි. (2) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.

(3) උපචිත සංකල්පයයි. (4) අස්තිත්ව සංකල්පයයි.

**1.7** 2021 ජනවාරි මාසයට අදාලව වෙළෙඳ ණයගැතියන් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු **ABC ට්‍රේඩර්ස්හි** පොත්වලින් උපුටාගන්නා ලදී:

| | **රු.** |
|---|---|
| 2021 ජනවාරි 01 දිනට වෙළෙඳ ණයගැති පාලන ගිණුමේ ශේෂය | 200,000 |
| 2021 ජනවාරි 31 දිනට වෙළෙඳ ණයගැති පාලන ගිණුමේ ශේෂය | 225,000 |
| 2021 ජනවාරි මාසය තුලදී ණයගැතියන්ගෙන් ලැබුණු මුදල් | 350,000 |
| 2021 ජනවාරි මාසය සඳහා ආපසු එවුම් ජර්නලයේ එකතුව | 25,000 |

ඉහත සඳහන් තොරතුරු අනුව, 2021 ජනවාරි මාසය තුල මුළු විකුණුම් වන්නේ:

(1) රු.400,000/- කි. (2) රු.375,000/- කි. (3) රු.350,000/- කි. (4) රු.450,000/- කි.

**1.8** **සීනා ට්‍රේඩර්ස්,** 2018 අප්‍රේල් 01 දින රු.2,000,000/- කට මෝටර් වාහනයක් අත්පත් කර ගන්නා ලදී. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ හීනවන ශේෂ ක්‍රමය භාවිත කරමින් මෝටර් වාහන ක්ෂය කිරීමයි. ක්ෂය අනුපාතය වර්ෂයකට 20% බැගින් වේ නම්, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ක්ෂය අයකිරීම වන්නේ:

(1) රු.400,000/-. (2) රු.320,000/-. (3) රු.800,000/-. (4) රු.720,000/-.

**1.9** **XYZ බැංකුවෙන්** බැංකු ණයක් ලබාගැනීම හේතුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම වනුයේ:

(1) වත්කම් වැඩිවීම සහ ස්කන්ධය (හිමිකම) වැඩිවීම.

(2) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම.

(3) වත්කම් අඩුවීම සහ වගකීම් අඩුවීම.

(4) ස්කන්ධය (හිමිකම) අඩුවීම සහ වගකීම් වැඩිවීම.

**1.10** කේවලස්වාමි ව්‍යාපාරයක අයිතිකරු වන **රණසිංහ,** ඔහුගේ පෞද්ගලික මෝටර් රථය, ඔහුගේ ව්‍යාපාරයට මාරු කළේය. මෙම ගනුදෙනුව වාර්තා කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ:

(1) මුදල් ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.

(2) මෝටර් වාහන ගිණුම හර සහ මුදල් ගිණුම බැර.

(3) මෝටර් වාහන ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.

(4) ප්‍රාග්ධන ගිණුම හර සහ මෝටර් වාහන ගිණුම බැර.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** ACCPAC, MYOB සහ SAGE යන ඒවා පොදු අවශ්‍යතා සඳහා වන (Tailor-made) ගිණුම්කරණ මෘදුකාංගවලට උදාහරණ වේ.

**1.12** දෙනලද කාලපරිච්ඡේදයක් අවසානයේදී මුදල් පාලන ගිණුමේ පෙන්නුම් කරන ශේෂය සැමවිටම හර ශේෂයකි.

**1.13** කේවලස්වාමි ව්‍යාපාරයක අයිතිකරු විසින් අමතර ප්‍රාග්ධනය හඳුන්වාදීම, කාලපරිච්ඡේදය සඳහා වන ව්‍යාපාරයේ ලාභයට / අලාභයට බලපානු ලැබේ.

**1.14** දේපළ, පිරියත සහ උපකරණ ණයට මිලදී ගැනීම, පොදු ජර්නලයේ වාර්තා කරනු ලැබේ.

**1.15** බැරපත, ව්‍යාපාර අස්තිත්වයක මූලාශ්‍ර ලියවිල්ලක් සඳහා උදාහරණයක් වේ.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම සඳහා හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** ගිණුම්කරණයේ අරමුණු දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.18** කේවලස්වාමි ව්‍යාපාරයක් වන **ජයවීරගේ ව්‍යාපාරයේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

| | **රු.** |
|---|---|
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 500,000 |
| 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුලදී සිදුකළ ගැනිලි | 100,000 |
| 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය | 200,000 |
| 2020 මාර්තු 31 දිනට වගකීම් | 150,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2020 මාර්තු 31 දිනට මුළු වත්කම් ගණනය කරන්න.

**1.19** මූල්‍ය තොරතුරුවල සීමාවන් දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** 2021 ජනවාරි මාසය තුළදී **පෙරේරාගේ ව්‍යාපාරයේ** පහත දැක්වෙන ණයට විකුණුම් ගනුදෙනු සිදුවී ඇත:

| දිනය | ඉන්වොයිස් අංකය | ගනුදෙනුකරුගේ නම | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල | වෙළෙඳ වට්ටම |
|---|---|---|---|---|---|---|
| 2021.01.05 | 101 | **සීමාසහිත ABC සමාගම** | කමිස | 10 | 800 | - |
| 2021.01.25 | 102 | **XYZ ට්‍රේඩර්ස්** | ගවුම් | 08 | 1,200 | 10% |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2021 ජනවාරි මාසය අවසානයේදී විකුණුම් ගිණුමට මාරු කළ යුතු වටිනාකම ගණනය කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

**සඳුන්, රජරට ස්ටෝර්ස්හි** ගිණුම් විධායකවරයෙකු වේ. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විටදී ශේෂ පිරික්සුම එකඟ නොවූ අතර, වෙනස වූ රු.334,000/- අවිනිශ්චිත ගිණුමකට හර කරන ලදී.

කෙසේවෙතත්, පහත සඳහන් වැරදි පසුව හඳුනා ගන්නා ලදි:

(1) නැවත විකිණීම සඳහා රු.75,000/- ක් වටිනා අයිතම වෙළෙඳ ණයහිමියෙකුගෙන් මිලට ගැනීම, වෙළෙඳ ණයහිමියන්ගේ ගිණුම සහ ගැනුම් ගිණුම යන ගිණුම් දෙකෙහිම වැරදීමකින් දෙවරක් සටහන් කර තිබුණි.

(2) රු.125,000/- ක් වටිනා කාර්යාල උපකරණයක් මිලට ගැනීම, කාර්යාල නඩත්තු වියදම් ගිණුමට හර කර තිබුණි. කෙසේවෙතත්, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(3) ගොඩනැගිල්ලේ අයිතිකරුට ගෙවූ 2020 මාර්තු මාසය සඳහා වන රු.76,500/- ක කුලිය, නිවැරදිව මුදල් පොතට බැර කර තිබුණ ද, ඊට අදාල හර සටහන අදාල ලෙජර් ගිණුමේ වාර්තා කර නොතිබුණි.

(4) 2020 මාර්තු මාසය සඳහා ගෙවූ රු.475,000/- ක වැටුප්, වැටුප් ගිණුමේ රු.47,500/- ක් ලෙස සටහන් කර තිබුණි. කෙසේවෙතත්, එය නිවැරදිව මුදල් පොතේ සටහන් කර තිබුණි.

(5) රු.100,000/- ක අත්පිට මුදලට විකුණුම්, විකුණුම් ගිණුමේ සටහන් කර නොතිබුණි. කෙසේනමුත්, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(6) ස්ථාවර තැන්පතුවක් මත ලැබූ රු.35,000/- ක පොලී ආදායම වැරදීමකින් පොලී වියදම් ගිණුමට හරකර තිබෙන නමුත් එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් **පිළියෙල කරන්න.** (ලකුණු 06)

(b) අවිනිශ්චිත ගිණුම **පිළියෙල කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**සැම්,** මූලික ප්‍රාග්ධනය වශයෙන් රු.580,000/- ක් මුදලින් ආයෝජනය කරමින් 2020 අප්‍රේල් 01 දින **සැම් ට්‍රේඩර්ස්** නමින් කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළේය.

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 අප්‍රේල් 30 දිනෙන් අවසන් වූ මාසය සඳහා මුදල් පාලන ගිණුම (මුදල් පොත) පහත පරිදි විය:

| | රු. | | රු. |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 580,000 | වැටුප් සහ වේතන | 1,375,000 |
| අමතර ප්‍රාග්ධන ආයෝජනය | 1,200,000 | කුලිය | 125,000 |
| මුදලට විකුණුම් | 5,500,000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 2,250,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,900,000 | ලොරි රථයක් මිලදී ගැනීම (2020 අප්‍රේල් 01 දින අත්පත් කරගන්නා ලදි) | 2,400,000 |
| | | මුදලට ගැනුම් | 2,000,000 |
| | | විදුලිය | 45,000 |
| | | ශේෂය ප/ගෙ | 985,000 |
| | **9,180,000** | | **9,180,000** |

(2) 2020 අප්‍රේල් 30 දිනට පහත ශේෂයන් ගිණුම් පොත්වල දක්නට ලැබුණි:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 1,400,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 2,100,000 |
| උපචිත වැටුප් | 25,000 |

(3) ලොරි රථය වාර්ෂිකව පිරිවැය මත 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(4) 2020 අප්‍රේල් 30 දිනට තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 අප්‍රේල් 30 දිනට **සැම් ට්‍රේඩර්ස්හි** ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**රාමනායක සෙරමික්,** සෙරමික් අයිතම නිෂ්පාදනය කරන ආයතනයක් වේ. පහත සඳහන් තොරතුරු 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **රාමනායක සෙරමික්හි** පොත්වලින් උපුටා ගන්නා ලදී:

| **විස්තරය** | **රු.** |
|---|---:|
| මිලට ගත් අමු ද්‍රව්‍ය | 2,100,000 |
| 2019 අප්‍රේල් 01 දිනට, අමුද්‍රව්‍ය තොගය | 650,000 |
| 2019 අප්‍රේල් 01 දිනට, නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 910,000 |
| ගෙනඒමේ කුලී - අමුද්‍රව්‍ය | 330,000 |
| සෘජු වේතන | 1,650,000 |
| විදුලිය | 400,000 |
| කම්හලේ විදුලි ජනක යන්ත්‍රය සඳහා ඉන්ධන | 125,000 |
| ලොරි රථය මත ක්ෂය | 250,000 |
| ගොඩනැගිලි මත ක්ෂය | 160,000 |
| කම්හල් ගොඩනැගිල්ලේ රක්ෂණය | 270,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනට අවසාන තොග පහත සඳහන් පරිදි ගණනය කරන ලදී:

| **විස්තරය** | **පිරිවැය (රු.)** |
|---|:---:|
| අමුද්‍රව්‍ය | 700,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 440,000 |

(2) පහත සඳහන් පරිදි සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය ප්‍රතිපාදනය කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ:

| | **අනුපාතය** |
|---|:---:|
| ගොඩනැගිලි | වාර්ෂිකව 10% බැගින් |
| ලොරි රථය | වාර්ෂිකව 25% බැගින් |

(3) පහත සඳහන් වියදම් පහත පරිදි බෙදා වෙන්කළ යුතුය:

| | **කර්මාන්තශාලාව** | **කාර්යාලය** |
|---|:---:|:---:|
| විදුලිය | 80% | 20% |
| ගොඩනැගිලි මත ක්ෂය | 80% | 20% |
| ලොරි රථය මත ක්ෂය | 90% | 10% |

(4) නිෂ්පාදනය කරන ලද භාණ්ඩ පිරිවැය මත 10% ක ලාභයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **රාමනායක සෙරමික්හි** නිෂ්පාදන ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(A) කේවලස්වාමි ව්‍යාපාරයක් වන **රාජා ස්ටෝර්ස්** නම් ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසය තුළදී පහත සඳහන් ගනුදෙනු සිදුවී තිබේ:

| **දිනය** | **ගනුදෙනුව** |
|---|---|
| 2021.01.01 | ප්‍රාග්ධනය වශයෙන් රු.2,000,000/- ක් මුදලින් යොදවමින් **රාජා** ව්‍යාපාරයක් ආරම්භ කළේය. |
| 2021.01.05 | නැවත විකිණීම සඳහා රු.750,000/- ක් වටිනා භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී. |
| 2021.01.10 | රු.500,000/- ක් පිරිවැය වූ තොග, රු.650,000/- කට ණයට විකුණන ලදී. |
| 2021.01.15 | වෙළෙඳ ණයගැතියෙකුගෙන් රු.400,000/- ක් ලැබුණි. |
| 2021.01.25 | 2021 ජනවාරි මාසයේ සේවක වැටුප් වශයෙන් රු.300,000/- ක් ගෙවන ලදී. |
| 2021.01.31 | රු.25,000/- ක් පිරිවැය වූ භාණ්ඩ, **රාජා** විසින් ඔහුගේ පෞද්ගලික භාවිතය සඳහා ලබාගන්නා ලදී. |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සටහන් කරන්න**.

*[තොග + වෙළෙඳ ණයගැතියෝ + මුදල් = ස්කන්ධය (හිමිකම) + වගකීම්]* (ලකුණු 06)

(B) **සීමාසහිත XYZ සමාගමෙහි** 2021 ජනවාරි 31 දිනට බැංකු ප්‍රකාශයේ රු.243,000/- ක වාසිදායක ශේෂයක් පෙන්නුම් කරන ලද අතර, **සීමාසහිත XYZ සමාගමේ** මුදල් පාලන ගිණුමේ රු.175,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්නුම් කරන ලදී.

වෙනස සඳහා හේතු පහත සඳහන් පරිදි වේ:

(1) බැංකුව, රු.5,000/- ක් බැංකු ගාස්තු වශයෙන් අඩුකරගෙන තිබෙන අතර, එය මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.

(2) ස්ථාවර තැන්පතුවක් මත පොලී ආදායම වශයෙන් රු.98,000/- ක පොලියක් බැංකුවට සෘජුවම ලැබී තිබේ. කෙසේනමුත් මෙය මුදල් පොතේ සටහන් වී නොතිබුණි.

(3) **සීමාසහිත XYZ සමාගම** විසින් 2021 ජනවාරි 29 දින නිකුත් කරන ලද රු.125,000/- ක චෙක්පතක් 2021 ජනවාරි 31 දින වන විටත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.

(4) බැංකුවෙහි තැන්පත් කරන ලද රු.150,000/- ක චෙක්පතක් 2021 ජනවාරි 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 02)

(b) 2021 ජනවාරි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**සහන ට්‍රේඩර්ස්** යනු **සහන්** ට අයත් තේවලස්වාමි ව්‍යාපාරයකි. 2020 මාර්තු 31 දිනට **සහන ට්‍රේඩර්ස්හි** ශේෂ පිරික්සුම පහත පරිදි විය:

**සහන ට්‍රේඩර්ස්**

**2020 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම | 2,000 | |
| ගොඩනැගිල්ල | 4,750 | |
| මෝටර් වාහන | 2,500 | |
| කාර්යාල උපකරණ | 1,700 | |
| 2019 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 1,250 |
| මෝටර් වාහන | | 520 |
| කාර්යාල උපකරණ | | 350 |
| විකුණුම් | | 48,000 |
| මිලදී ගැනුම් | 27,170 | |
| 2019 අප්‍රේල් 01 දිනට තොගය | 2,900 | |
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 9,000 |
| ස්ථාවර තැන්පතුව (2019 ඔක්තෝම්බර් 01 දින ආයෝජනය කරන ලදී) | 1,500 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 4,100 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,895 |
| විදුලිය | 1,200 | |
| වැටුප් සහ වේතන | 6,200 | |
| ප්‍රවාහන වියදම් | 500 | |
| ජලය | 190 | |
| බැංකු ගාස්තු | 25 | |
| ප්‍රදර්ශනාගාරයේ කුලිය | 1,100 | |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම | | 50 |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 5,230 | |
| | **61,065** | **61,065** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනට අවසාන තොගය, පිරිවැයට රු.3,500,000/- කට අගය කරන ලදී.

(2) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂයකට 10% බැගින් |
| මෝටර් වාහන | : | වර්ෂයකට 25% බැගින් |
| කාර්යාල උපකරණ | : | වර්ෂයකට 10% බැගින් |

(3) ස්ථාවර තැන්පතුව සඳහා අදාළ වන පොලී අනුපාතය වර්ෂයකට 8% ක් වන අතර, 2020 මාර්තු මාසය සඳහා ලැබිය යුතු පොලිය **සහන ට්‍රේඩර්ස් හි** ගිණුම් පොත්වල ගිණුම්ගත කර නොතිබුණි.

(4) ගිණුම් පොත්වල වාර්තාකර නොතිබූ 2020 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු බිල් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| විදුලිය | : | රු.75,000/- |
| ජලය | : | රු.21,000/- |

(5) **සහන ට්‍රේඩර්ස්,** 2019 අප්‍රේල් 01 දින, ප්‍රදර්ශනාගාරය සඳහා කුලී ගිවිසුමට එළඹුණු අතර, ප්‍රදර්ශනගාරයේ මාසික කුලිය රු.100,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |